# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1323/14 - 2004 ජනවාරි 13 වැනි අඟහරුවාදා - 2004.01.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (v).

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

27 (1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තෘතීයික අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1995 නොවැම්බර් මස 07 වැනි දින අංක 896/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය සම්බන්ධ නියමය, එකී නියමයෙහි 1 වන තීරයේ "ව්‍යාපාර අධ්‍යයන පීඨය" යන අයිතමය වෙනුවට "කළමනාකරණ අධ්‍යයන පීඨය" යන අයිතමය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කබීර් හෂීම්,
තෘතීයික අධ්‍යාපන හා පුහුණු අමාත්‍ය.

2003 දෙසැම්බර් මස 31 වැනි දින,
තෘතීයික අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය,
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07 දීය.

01-773

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A-G 003965 - 1,035 (2004/01)